2026 ක් වූ මාර්තු මස 10 වන දින දීය

වාණිජ බදු ගිවිසුම් - Commercial Leases

වාණිජ බදු ගිවිසුම් පිළියෙල කිරීම

බොහෝ වාණිජ ව්‍යාපාර වල යෙදෙන්නන් දේපල හිමිකරුවකුගෙන් කඩකාමරයක් යම් කාලසීමාවක් සඳහා බද්දට ගැනීම සාමාන්‍යයෙන් සිදුවන දෙයකි. එකී කාලසීමාව අවසන් වනතෙක් බදුගැනුම්කරු බදු ගිවිසුමේ සඳහන් සියලුම නියමයන් හා කොන්දේසි පිලිපැදිය යුතු අතර ඒවා කිසි ආකාරයකින් උල්ලංගනය නොකලයුතුය.

වාණිජ බදු ගිවිසුම් Retail and Commercial Leases Act 1995 (SA) යන පනත මගින් නීති ගත කර ඇත. සාමාන්‍යයෙන් මෙම පනතට අනුව අවම බදුකාලසීමාව වන්නේ වසර 5 ක් වන අතර මහජනයාට බඩු/ආහාර විකුනන ආයතන මෙන්ම කාර්යයාලද ඇතුලුව ඕනෑම ව්‍යාපාර ආයතනයක් සඳහා බල පැවැත්වේ. තවද මෙම පනත බද්ද ඩොලර් 420,000 නොඉක්මවන ඕනෑම වාණිජ බදු ගිවිසුමක් සඳහා වලංගුවේ.

පනතේ විධිවිධාන වලට පටහැනිව දේපල හිමිකරුට කුලීනිවැසියන් ගෙන් හිතුමතේට අයකරගැනීම් කළනොහැකිය. උදාහරනයක් වශයෙන් Land Tax අය කර ගත නොහැකිය.

බදු කාලසීමාව තුල අලුත්වැඩියාවන් කුලීනිවැසියන් විසින් සිදුකරගත යුතුය. ඊට අමතරව වරිපනම් බදු, ජල පහසුකම් බද්ද, ගොඩනැගිලි රක්ශණ ආවරන, මහජන ආරක්ශන රක්ශණ ආවරන හා වීදුරු සඳහා වන රක්ශණ ආවරන කුලීනිවැසියන් විසින් ගෙවීම් සිදුකර පවත්වාගෙන යා යුතුය.

දැනටමත් ගිවිසුමේ පිටපතක් ලැබී ඇත්නම් ඔබට එය පැහැදිලි කර ගැනීමට අවශ්‍ය ද?

බදු ගිවිසුම් හා වාණිජ ගිවිසුම් පැහැදිලි කිරීම, ඒ ආශ්‍රිත නීතී රීතීන් පැහැදිලි කර දීම, පාර්ශවයන් අතර ඇතිවන ආරවුල් සඳහා මැදිහත් වීම හා ඒවා සමතයකට පත් කිරීම, බදු ගිවිසුම් සකස් කර දීම සහ ඒ ආශ්‍රිත සියළුම ලේඛන සැකසීම අපගේ නීති කන්ඩායම විසින් සාධාරණ අයකිරීමක් මත කර දෙනු ලැබේ.

බදු පිළිබඳ මනා දැනීමක් ඇති අපගේ සොලිසිටර්වරුන් විසින්, ගොඩනැගිලි සංවර්ධනය කරනු ලබන සමාගම්, බදු ඒජන්තවරුන්, බ්‍රෝකර් වරුන්, ඉඩම් හිමියන් හා කුලීනිවැසියන් වෙනුවෙන් උපදෙස් දිය හැකිය.

වානිජ හා සිල්ලර ව්‍යාපාරිකයන්ගේ බදු පිළිබඳ නීතිමය ගැටළු සඳහා අපගේ සේවාව සඳහා විමසන්න.

එසේනම් Troubridge Barristers & Solicitors හී අපව හමුවන්න.